# පුරප්පාඩු නිවේදනය

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

GCF Knuckles PROJECT

# නකල්ස් කඳු වැටියේ (GCF – නකල්ස් ව්‍යාපෘතිය) යැපුම් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් සහ වතු වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එය දිස්ත්‍රික් පාදක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක තුනක ක්‍රියාත්මක කෙරේ. ප්‍රධාන වශයෙන් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 39.7 ක දායකත්වයක් සහ දේශීය මූලාශ්‍රවලින් අතිරේක ඇමරිකානු ඩොලර් මිලියන 9.2 ක දායකත්වයක් සහිතව අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක පහ පුරා ක්‍රියාත්මක කිරීමට නියමිතය. බඳවා ගැනීම් කොන්ත්‍රාත් පදනමක් මත සිදු කෙරෙන අතර, කළමනාකරණ සේවා චක්‍රලේඛය (DMS) අංක 02/2026 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය අවශ්‍යතා වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල පූර්ව සේවා පළපුරුද්ද සහ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර වාසි ලෙස සලකනු ලැබේ. මෙම ව්‍යාපෘතිය 2029.02.28 දිනෙන් අවසන් වීමට නියමිතය.

| අංක | කාණ්ඩය | තනතුර | තනතුරු සංඛ්‍යාව | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 1 | B | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | DMS No. 02/2026 |
| 2 | D1 | ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | |

අයදුම්පත් **2026 මැයි 19 දින හෝ ඊට පෙර** ලැබීමට පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

කෙටි ලැයිස්තුගත කර ඇති අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයක සිදුකරනු බලපෑම් වහාම නුසුදුස්සකු වීමට හේතු වන අතර, එවැනි අයදුම්පත් සලකා බලනු නොලැබේ. බඳවා ගැනීම පිළිබඳ අවසන් තීරණය අමාත්‍යාංශ ලේකම් සතු වේ

**ජාතික ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**GCF නකල්ස් ව්‍යාපෘතිය,**
**10 වන මහල, අංක 500,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරී ගොඩනැගිල්ල,**
**ටී.බී. ජයා මාවත, කොළඹ 10.**

**ලේකම්**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය